| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2023 |
| **6 ශ්‍රේණිය** | **ඉතිහාසය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1යි

## I කොටස

01)මහාවංශයේ මුල් කොටස රචනා කරන ලද්දේ
1) බුද්ධඝෝෂ හිමිය 2) ධාතුසේන රජතුමාය
3) මහානාම හිමිය 4) මහා පරාක්‍රමබාහු රජතුමාය

02)පොළොන්නරුවේ ගල් විහාරය කරවන ලද්දේ
1) දුටුගැමුණු රජතුමා 2) පණ්ඩුකාභය රජතුමා
3) I වන පරාක්‍රමබාහු රජතුමා 4) I වන විජයබාහු රජතුමා

03)ක්‍රිස්තු වර්ෂ 2023 බුද්ධ වර්ෂ වලින් දක්වන්න.
1) 2019 2) 2567 3) 2100 4) 1384

04)"පෘථිවිය සෑදී ඇත්තේ අහසේ තිබූ දූවිලි වලාකුළකිනි." එවැනි වලාකුළු හඳුන්වන නම වන්නේ
1) නිහාරිකාව 2) ලාවා 3) වල්ගාතරු 4) ක්ෂීර පථය

05)"හැකි මිනිසා" නමින් හඳුන්වන මානව වර්ගය වන්නේ
1) ඔස්ට්‍රලෝපිතිකස් 2) හෝමෝ හැබිලිස්
3) හෝමෝ ඉරෙක්ටස් 4) හෝමෝ සාපියන්

06)මිනිසා මුල්වරට ගින්දර භාවිතා කිරීම පිළිබඳව සාක්ෂි සොයාගෙන ඇත්තේ
1) චීනයෙන්ය 2) ඊශ්‍රායලයෙන්ය
3) ඉන්දියාවෙන්ය 4) අප්‍රිකාවෙන්ය

07)මානව පරිණාමය ලෙස හැඳින්වෙන්නේ
1) සත්ත්ව පරිණාමයයි
2) පෘථිවියේ ජීවීන් බිහිවීමයි
3) වානර පරම්පරාවකට අයත් චිම්පන්සියෙකුගෙන් මිනිසා බිහිවීමේ ක්‍රියාවලියයි
4) මිනිසා දියුණුවට පත්වීමයි

08)ගොඩබිම සතුන් පැතිරගිය යුගය හඳුන්වන්නේ
1) පැලියොසොයික යුගය 2) මහා හිම යුගය
3) සිලුරියන් යුගය 4) පුරාශිලා යුගය

09)දුනු ඊතල භාවිතකර දඩයම් කිරීම ආරම්භ වූයේ

1) මහා හිම යුගයේදී ය
2) පුරා ශිලා යුගයේදී ය
3) නව ශිලා යුගයේදී ය
4) මධ්‍යශිලා යුගයේදී ය

10)"වී" මුල්වරට වගා කර ඇත්තේ

1) මධ්‍යම මෙක්සිකෝවේය
2) නයිල් ගඟ අසබඩය
3) චීනයේ ය
4) මෙක්සිකෝවේ ය

11)පළමුවරට රබර් බෝලයක් තැනීමේ ගෞරවය හිමිවන ශිෂ්ටාචාරය

1) ඊජිප්තුශිෂ්ටාචාරය
2) මායා ශිෂ්ටාචාරය
3) චීන ශිෂ්ටාචාරය
4) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

12)මෙසපොතේමියානු ශිෂ්ටාචාර වැසියන් පොළොවට අධිපති දෙවියන් හැඳින්වූ නම කුමක්ද?

1) එන්ලිලී
2) අනු
3) සියුස්
4) එන්කිකී

13)මැටි පුවරුවක සකස්කළ ලොව පැරණිම නීති පොත සකස් කළ මෙසොපොතේමියානු පාලකයා කවුද?

1) ගිල්ග - මේෂ්
2) හමුරාබි
3) ධොලවීර
4) ටූටන්කාමන්

14)ඊජිප්තු වැසියන් ලොවට දයාද කළ විශිෂ්ඨතම නිර්මාණය කුමක්ද?

1) මුද්‍රණ යන්ත්‍රය
2) අක්ෂර මාලාව
3) ලෝහ තාක්ෂණය
4) පිරමීඩ

15)බොහෝ සාරවත් දේ නිපදවූ මානවයා හඳුන්වන්නේ

1) හෝමෝ සාපියන් නමිනි
2) හෝමෝ ඉරෙක්ටස් නමිනි
3) හෝමෝ හැබිලස් නමිනි
4) හෝමෝ නියැන්ඩතාල් නමිනි

16)දුප්පත් පොහොසත් බෙදීම මුල්වරට ඇතිවූයේ

1) පුරා ශිලා යුගයේ දී
2) නව ශිලා යුගයේ දී
3) මධ්‍ය ශිලා යුගයේ දී
4) දඩයම් යුගයේ දී

17)

- සිගුරාට් නමින් හැඳින්වූ දේවාල
- ගංගාවල යාත්‍රා කරන කුඩා නැව් තැනීම

ඉහත නිර්මාණ ලොවට දායාද කළ ශිෂ්ටාචාරය වන්නේ

1) චීන ශිෂ්ටාචාරය
2) මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය
3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය
4) ඊජිප්තු ශිෂ්ටාචාරය

18)විජය ඇතුළු හත්සියයක් පිරිස මෙරටට ගොඩ බසින ලද ස්ථානය වන්නේ

1) තම්බපණ්ණිය
2) ලංකාපුරය
3) මාතොට
4) ගොඩවාය

19)අපේ රටට මුලින්ම මිනිසුන් පැමිණියේ අදින් කොපමණ කළකට පෙරදීද?

1) අවුරුදු පනස්දහකට පෙරය
2) අවුරුදු දශලක්ෂයකට පෙරය
3) අවුරුදු එක්ලක්ෂ විසිපන්දහකට පෙරය
4) අවුරුදු පනස්දහසකට පෙරය

20)ගල් යුගයේ ජීවත් වූ මානවයා ඇටසැකිලිමත ආලේප කිරීමට යොදා ගන්නා ලද ගල් විශේෂය වන්නේ
1) ගුරු ගල්ය 2) හිරිගල් ය 3) කළුගල් ය 4) බොරළු ය
(ලකුණු 2x20=40)

## II කොටස

**පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.**

01)
- i. ඔබ දන්නා පුරාවිද්‍යා මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල 2)
- ii. ක්‍රිස්තු පූර්ව හා ක්‍රිස්තු වර්ෂ අතර වෙනස කෙටියෙන් පහදන්න. (ල 4)
- iii. ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ල 6)

02)
- i. මානව පරිණාමයේ අවධි දෙකක් ලියන්න. (ල 2)
- ii. හෝමෝ සාපියන් මානවයාගේ විශේෂතාවන් දෙකක් සඳහන් කරන්න. (ල 4)
- iii. නව ශිලා යුගයේ මානවයාගේ ජීවන රටාව පිළිබඳව වාක්‍ය 05ක් ලියන්න. (ල 6)

03)
- i.
  - A- තිරිඟු මුල්වරට වගාකළ ප්‍රදේශය නම් කරන්න. (ල 1)
  - B- ගිනි කඳු පිපිරීමේ දී ඉන් පිටතට ගලා යන ද්‍රව්‍ය හඳුන්වන නම ලියන්න. (ල 1)
- ii. විවිධ දේහ ලක්ෂණ සහිතව ලෝකයේ ව්‍යාප්ත වූ හෝමෝ සාපියන්වරු වර්ග දෙකක් නම් කරන්න. (ල 4)
- iii. මිනිසා ගොවිතැනට යොමුවීමත් සමඟ ඔවුන්ගේ ජීවන රටාව වෙනස් වූ ආකාරය හා ලබාගත් ජයග්‍රහණ පිළිබඳව වාක්‍ය පහක් ලියන්න. (ල 6)

04)
- i. ලොව මුල්ම ශිෂ්ටචාර ආරම්භ වූ ගංගා නිම්න දෙකක් නම් කරන්න. (ල 2)
- ii. පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරු සම්බන්ධ ශිෂ්ටාචාරය නම් කරන්න. (ල 4)
  - A- හරප්පා, බොලවීර ප්‍රධාන නගර
  - B- කඩදසි නිෂ්පාදනය
  - C- ලෝහ නගුල් හා ගලින් තැනූ උදලු භාවිතා කිරීම
  - D- පිරමීඩ නිර්මාණය
- iii. මෙසොපොතේමියානු ශිෂ්ටාචාරය පිළිබඳව වැකි පහක් ලියන්න. (ල 6)

05)
- i. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පැවති ප්‍රදේශයට වර්තමානයේ අයත්වන රටවල් දෙකක් නම් කරන්න. (ල 2)
- ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් පූජක මූර්තියේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල 4)
- iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල 6)

06)

i.

(A) ඊජිප්තු අක්ෂර පද්ධතිය හැඳින්වූ නම සඳහන් කරන්න. (ල 1)

(B)ලෝක පුදුම හත අතරට එකතු වූ ඊජිප්තු පිරමීඩ පිහිටි ස්ථානය නම් කරන්න. (ල 1)

ii. ඊජිප්තු ශිෂ්ටාචාරයෙන් ලෝකයට ලැබුණු දයාද දෙකක් ලියන්න. (ල 4)

iii. ඊජිප්තු ශිෂ්ටාචාරයේ සුවිශේෂී ලක්ෂණ පහක් ලියන්න. (ල 6)

07)

i. මෙරට ආදි මුතුන්මිත්තන් ජීවත් වූ ගල්ගුහා වාසස්ථානයක් පිහිටි ස්ථානයක් නම් කරන්න. (ල 2)

ii. ආදි මානවයන් ආහාරයට ගත් ශාකමය ආහාර සහ සත්ව ආහාර දෙක බැගින් ලියන්න. (ල 4)

iii. දඩයම් කරමින් ජීවත් වූ මෙරට ගල් යුගයේ ජනතාවගේ ජීවන රටාව පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල 6)